අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | Fax: +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/05/84/10/12-2019

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2019.05. 17

පාර්ලිමේන්තුවේ මහලේකම්,

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිබඳ නිරීක්ෂණ සහ ගනු ලැබූ පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කර ඇති 2019.04.04 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව 2019.04.04 වන දින පාර්ලිමේන්තුව හමුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 76 දරණ වාර්තාවේ අධ්‍යාපන අමාත්‍යාංශයට අදාල කරුණු සම්බන්ධයෙන් ගෙන ඇති පියවරයන් හා මාගේ නිරීක්ෂණ මේ සමඟ ඉදිරිපත් කරමි.

අකිල විරාජ් කාරියවසම්
අධ්‍යාපන අමාත්‍ය
අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 | Fax: +94112784825 | minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary } +94112784811 | Fax: +94112785162 | secretary.education@moe.gov.lk

<table>
<tr><th></th><th>වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු/ කාරක සභාව විසින් ලබාදුන් නියෝග</th><th>ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම/ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්වය</th></tr>
<tr><td></td><td colspan="2">අධ්‍යාපන අමාත්‍යාංශය<br>2018 අගෝස්තු 24</td></tr>
<tr><td>1.</td><td>ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය පිළිබඳ වර්තමාන ප්‍රගතිය<br><br>දස අවුරුදු ස්ථාන මාරු අදියර තුනම ක්‍රියාත්මක කර අවසන් බවත්, අභියාචනා කටයුතුද මාරු මණ්ඩලද පවත්වා අවසන් බවත් ප්‍ර.ග.නි. සඳහන් කළේය. එහෙත් සමහර දුෂ්කර පළාත්වල මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ගැටළු මතුවී ඇති බැවින් ඒ සඳහා පළාත් සහා සමඟ සම්බන්ධ වෙමින් ගුරුවරුන් හුවමාරු කර ගැනීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් සැමට සාධාරණයක් සිදු වන අයුරින් මෙම ප්‍රතිපත්තිය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.</td><td>2018 හා 2019 වර්ෂයන්ට අදාළව ජාතික පාසල් වෙතින් ලැබී ඇති වාර්ෂික අයදුම්පත්‍ර හා වසර 10ට වැඩි ගුරු ස්ථානමාරු අයදුම්පත්‍ර, ගුරු ස්ථානමාරු මණ්ඩලයක් මගින් පරීක්ෂා කර බලා විෂයන් අනුව හා පවතින ගුරු පුරප්පාඩු මත ගැලපීම් සිදුකර ස්ථානමාරු සිදුකළ ගුරු සංඛ්‍යා පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.<br><br>
<table>
<tr><th></th><th colspan="3">2018</th><th colspan="3">2019</th></tr>
<tr><td></td><td>වාර්ෂික</td><td>දස අවුරුදු</td><td>මුළු</td><td>වාර්ෂික</td><td>දස අවුරුදු</td><td>මුළු</td></tr>
<tr><td>මුළු අයදුම්පත් සංඛ්‍යාව</td><td>2,902</td><td>10,589</td><td>13,491</td><td>4,826</td><td>2,400</td><td>7,226</td></tr>
<tr><td>ස්ථානමාරු කළ සංඛ්‍යාව</td><td>1,165</td><td>7,199</td><td>8,364</td><td>1,440</td><td>1,210</td><td>2,650</td></tr>
<tr><td>ස්ථානමාරු කළ ප්‍රතිශතය</td><td>40%</td><td>60%</td><td>62%</td><td>30%</td><td>51%</td><td>37%</td></tr>
</table>
<br>ඒ අනුව එකම ජාතික පාසලේ සේවා කාලය වසර 10ට වැඩි වුවද ගුරුභවතුන් අතරින් විෂයට අදාළව අනුප්‍රාප්තිකයන් ගලපා ගැනීමේ අපහසුතාවය, ප්‍රාදේශීයව පිහිටි හුදෙකලා පාසල්වල ගුරුභවතුන් වෙනුවෙන් අනුප්‍රාප්තිකයෙකු ගලපා ගත නොහැකි වීම මත හා නිර්දේශිත වයස් සීමාව ඉක්ම වීම මත, ස්ථානමාරු කිරීමට නොහැකි වූ ගුරුභවතුන් ප්‍රමාණයක් වාර්ෂිකව පාසල් වල ඉතිරි වන අතර විෂයට අදාළව අනුප්‍රාප්තිකයන් ගැලපීම මගින් එම ගුරුභවතුන් ද ඉදිරියේදී ස්ථානමාරු කිරීමට නියමිතය.</td></tr>
<tr><td>2.</td><td>පාසල් පද්ධතියේ සිදු වූ අක්‍රමිකතා හා අවිනය ක්‍රියා හේතුවෙන් පාසැල් පද්ධතිය තුළ නොවිසිඳී පැවතුනු පැවතුනු ගැටළු පිළිබඳ වර්තමාන තත්වය කාරක සභාවේ විමසීමට භාජනය විය. 2018 ජනවාරි 19 දින වන විට විසඳා අවසන් කර නොතිබුණු විනය ගැටළු ප්‍රමාණය 554ක් බව කාරක සභාවේදී අනාවරණය විය.<br>මෙම ගැටළු නිරාකරණය සඳහා විශාල කාලයක් ගත වීම හා ඒ හේතුවෙන් වෙනත් ගැටළු මතුවීම පිළිබඳව කාරක සභාවේ දැඩි අවධානය යොමු වූ අතර මෙම ගැටළුකාරී තත්වය පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානය යොමුකර පාසැල් පද්ධතියේ සිදුවන අක්‍රමිකතා හා අවිනය ක්‍රියා හේතුවෙන් මතුවී ඇති පැමිණිලි හා ගැටළු නිරාකරණය සඳහා ඇති ගැටළු නිරාකරණය සඳහා ඇති යාන්ත්‍රණය හා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් රාජ්‍ය සේවා කොමිෂන්</td><td>❖ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දිවයින පුරා විහිදී පවතින ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරින් සම්බන්ධව ලැබෙන පැමිණිලි මෙන්ම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කර ඇති විගණන පරීක්ෂණ ද සම්බන්ධ විමර්ශන කටයුතු වලට අදාළව ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයට අනුව මූලික විමර්ශන සිදු කිරීම හා චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීමේ කටයුතු විමර්ශන නිලධාරි සතු කාර්යය භාරයකි. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සතු විමර්ශන නිලධාරි සංචිතය ඉතා කුඩා ප්‍රමාණයක් වන බැවින් විමර්ශන නිලධාරි තනතුරු ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත.<br><br>❖ විමර්ශන නිලධාරි පත්වීම් ලිපියෙහි විමර්ශනය අවසන් කර වාර්තාව ලබා දිය යුතු කාලය නිශ්චිතව දක්වා ඇති අතර එම කාලය ඉක්මවා යන බවක් නිරීක්ෂණය වන විට දුරකථන මාර්ගයෙන් හෝ සිහිපත් යොමු කිරීම තුළින් හෝ විමර්ශන</td></tr>
</table>

| | | |
|---|---|---|
| | සභාවෙන් කැඳවීමට තීරණය කරන ලදී. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇති අතර තවදුරටත් විමර්ශනය ප්‍රමාදවන්නේනම් අතුරු වාර්තාවක් හෝ ලබා දෙන ලෙස විමර්ශන නිලධාරින් දැනුවත් කර ඇත.<br><br>❖ විමර්ශනයෙන් අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටසේ විධිවිධාන ප්‍රකාර පළමු උපලේඛනයේ සඳහන් වරදවල් සඳහා සහ දෙවන උපලේඛනයේ සඳහන් වදරදවල් සඳහා චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීම.<br><br>❖ විමර්ශන නිර්දේශ අනුව චෝදනා පත්‍රයක් නිකුත් නොකරනු ලබන අවස්ථාවලදී ලඝු විනය යටතේ අවවාද කිරීම්, ස්ථාන මාරුකිරීම් සිදුකර විනය කටයුතු අවසන් කිරීම.<br><br>❖ මූලික විමර්ශනයක් සිදු නොකරන සෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන්ම ඒ පිළිබඳව විදුහල්පති/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් වාර්තා කැඳවා එම පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.<br><br>❖ කෙසේ වුවද පරීක්ෂණ නිලධාරීන් පත් කිරීමෙන් පසු විධිමත් විනය පරීක්ෂණ වාර්තාව ලබා දීම සම්බන්ධයෙන් අදාල නිලධාරින් වෙත සිහිකැඳවීම් යොමු කර විනය ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.<br><br>❖ දැනට අවසන් වාර්තා ලබා දී නොමැති නඩු සම්බන්ධයෙන් වන තොරතුරු, අමාත්‍යාංශයේ නීති නිලධාරි/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු මාර්ගයෙන් අදාළ අධිකරණවල රෙජිස්ට්‍රාර්වරු දැනුවත් කිරීමෙන් එම අවසන් නඩු වාර්තා ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.<br><br>❖ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ, අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ වලට අදාළව කටයුතු කල යුතු ආකාරය පිළිබඳව විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.<br><br>❖ විනය ක්‍රියාපටිපාටිය පිළිබඳව විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.<br><br>❖ පාසල් පද්ධතියේ පරිපාලනමය ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීම.<br><br>2019.02.28 දිනට විනය ගොනු වල වර්තමාන තත්ත්වය ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත. |
| 3. | **විදුහල්පතිවරු බඳවාගැනීම පිළිබඳ වර්තමාන තත්ත්වය කාරක සභාවේ විමසීමට ලක්විය. 2017 දෙසැම්බර් 31 දිනට ජාතික පාසැල් 353න් 259ක විදුහල්පති පුරප්පාඩු පැවති අතර, ඒ සඳහා වැඩ ආවරණ කරන පත්වීම් ලබා දී තිබීම.**<br><br>ජාතික පාසැල්වල විදුහල්පතිවරුන් සඳහා වන නීත්‍යානුකූල පත්කිරීම් සිදු කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත් 2018 සැප්තැම්බර් මස අදාල අයදුම්කරුවන් සඳහා සම්මුඛ | ▪ දිවයිනේ ජාතික පාසල් 302 ක පවතින විදුහල්පති තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණය 2018 ඔක්තොම්බර් මස 16, 18, 19, 20, 22, 23, 25, 26, 27 යන දිනයන්හිදීත් නොවැම්බර් මස 26, 27, 29 යන දිනයන්හිදී සහ දෙසැම්බර් මස 01, 02, 03, 04, 06, 07, 14,17 දිනයන්හි පවත්වන ලද අතර එම පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණය අනුව යෝජිත නිලධාරීන්ගේ නාම ලේඛනය හා සම්මුඛ පරීක්ෂණයට අදාල අනෙකුත් සියළුම ලේඛණ අංක ED/4/58/20/ESC(ii) හා 2019.02.13 දිනැති ලිපිය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා |

| | | |
|---|---|---|
| | පරීක්‍ෂණ පැවැත්වීම සිදු කිරීමට නියමිත බවත් ප්‍ර.ග.නි. පැවසීය. | කමිටුව වෙත යොමු කරන ලදී.<br><br>▪ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම්ගේ අංක ESC/APP/SLPS/04/59/2017 (VOL II) හා 2019.03.01 දිනැති ලිපිය මගින් පාසල් බොහොමයක් සඳහා නියමිත සේවයේ/ ශ්‍රේණියේ නිලධාරීන් ඉල්ලුම් කර නොතිබීම මත එම සම්මුඛ පරීක්ෂණය හා සම්මුඛ පරීක්ෂණ ලේඛණ අවලංගු කිරීමට තීරණය කර ඇත.<br><br>▪ මේ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සමඟ තවදුරටත් සාකච්ඡා කරමින් පවතී. |
| 4. | **ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුව ජාත්‍යන්තර පාසැල් අධීක්‍ෂණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් වුවත් ඒ පිළිබඳ වැඩපිළිවෙලක් මෙතෙක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හා ජාත්‍යන්තර පාසැල්වල සිසුන් වර්ෂය අතරමැදදී රජයේ පාසැල්වලට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නව චක්‍ර ලේඛයක් නිකුත් කර නොතිබීම.**<br><br>ජාත්‍යන්තර පාසැල් නියාමනයට මෙතෙක් තම අමාත්‍යාංශයට බලතල නොතිබූ බව සඳහන් කළ ප්‍ර.ග.නි., අගමැතිතුමා ඉදිරිපත් කල කැබිනට් පත්‍රිකාවකට අනුව එම බලතල ලැබීමට නියමිත බවද, ඒ අනුව ජාත්‍යන්තර පාසැල්වල සියලු කටයුතු අධීක්ෂණයට නියාමන කමිටුවක් හෝ කොමිසමක් පත් කිරීමට යෝජිත බවද සඳහන් කළේය.<br><br>ජාත්‍යන්තර පාසැල්වල ඉගෙනීම මත එම දරුවන් වෙනස්කමකට භාජනය නොවිය යුතු බවත්, හිතකර නියාමනයක් සිදුවීම වැදගත් බවත් කාරක සභාව අවධාරණය කළේය. | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යාන්තර පාසල් අධීක්‍ෂණය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුණක් වේ. එහෙයින්, ජාත්‍යාන්තර පාසල් නියාමනයට ලක් කිරීමට හැකිවන පරිදි නීති සංශෝධනය කිරීම අත්‍යාවශ්‍ය කාරණයකි. ඒ සඳහා 1961 අංක 08 දරණ උපකෘත පාසල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වගන්තිය සංශෝධනය කිරීම ( පෞද්ගලික පාර්ශවයන්ටද පාසල් ආරම්භ කිරීමට හැකිවන පරිදි) කල යුතු අතර, එය සමාජමය හා දේශපාලනමය වශයෙන් සංවේදී කාරණයක් වියහැකි වන හෙයින් මේ වන තුරු මෙම වගන්තිය සංශෝධනය වී නොමැත.<br><br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් (අංක MNPEA/2018/064 හා 2018.04.09 දිනැති) ඉදිරිපත් කරන ලදී. ඊට අදාලව 2019.01.22 දින ලබාදී ඇති අමාත්‍ය මණ්ඩල තීරණයේ (අංක 19/0132/105/003 හා 2019.01.30 දිනැති) සඳහන් කර ඇත්තේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා එක්ව ජාත්‍යන්තර පාසල්වල තත්ව සහතික කිරීම සහ අධීක්‍ෂණය කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ලවා කඩිනමින් කෙටුම්පත් කරවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, එම කෙටුම්පත් ප්‍රතිපත්තිය සලකා බැලීම පිණිස ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු අමාත්‍යතුමා හා අධ්‍යාපන අමාත්‍යතුමා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසත්ය. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර පාසල් සම්බන්ධ ඉහත ප්‍රතිපත්තිය කෙටුම්පත් කර, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලැබීමෙන් පසු ජාත්‍යන්තර පාසල් සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයට කටයුතු කිරීමේ හැකියාව ලැබෙනු ඇතැයි අපේක්‍ෂා කෙරේ.<br><br>එසේම ජාත්‍යන්තර පාසල්වල සිසුන් අතරමැදි පන්ති සඳහා රජයේ පාසල්වලට ඇතුලත් වීමේදී වයස් මට්ටම හා සාධන මට්ටම පිළිබඳව විශේෂ අවධානය යොමු කරනු ලබයි. එබැවින් අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග සඳහා පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටීමේදී වයස් සීමාවේ විශේෂ වරප්‍රසාදයක් ඔවුන් හිමි නොවේ. එම නිසා රජයේ පාසල් වල එම වයස් සීමාවේ පසුවන සිසුන්ට ජාත්‍යන්තර පාසල් වලින් පැමිණි සිසුන් නිසා, වයස් සීමාව මුල් කරගෙන අසාධාරණයක් සිදු නොවේ. |
| 5. | **පිරිවෙන් නියාමනය ක්‍රමානුකූල කර පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමට බලපා ඇති කරුණු අධ්‍යනය කිරීමේ වර්තමාන තත්වය** | පිරිවෙන් අධීක්ෂණ හා නියාමන නිලධාරීන් වැඩිකර ඇත. සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ හිමිවරු 18ක්, විෂය අධ්‍යක්ෂවරු 12ක්, පිරිවෙන් සම්බන්ධීකරණ නිලධාරීන් 30 ක් හා ගුරු උපදේශකවරු 190ක් මේ වන විට සේවයේ නිරතව සිටී. |

<table>
<tr>
<td></td>
<td>පිරිවෙන් අධීක්ෂණය මෙතෙක් සිදු කරනු ලැබුවේ ගරුතර ස්වාමීන් වහන්සේ නමක් බවත්, මේ වන විට පරිපාලන සේවයේ සිවිල් පරිපාලන සේවයේ සිවිල් නිලධාරියකු මේ සඳහා පත්කර ඇති බවත්, මේ වන විට දිස්ත්‍රික්ක කිහිපයක පිරිවෙන් අධීක්ෂණ කටයුතු අවසන් කර බොහෝ අතපසුවීම් හා වැරදි නිවැරදි කරමින් පවතින බවත් ප්‍ර.ග.නි. සඳහන් කළේය.</td>
<td>කාර්යාල කටයුතු හා විෂය අධීක්ෂණය කරනු ලබයි. වර්තමානයේ පිරිවෙන් නියාමනය සතුටුදායකයි.<br><br>වර්තමානය වන විට පිරිවෙන් ශාඛාවේ අධ්‍යක්ෂවරයෙකු සිටින අතර ගුරු-ශිෂ්‍ය තුලනය කර පිරිවෙන්වලට අවශ්‍ය වන ප්‍රමාණයට ගුරුවරු ලබා දී ඇත. විෂයානුබද්ධව ගුරුපත්වීම් ලබාදී ඇත්තේ පුරප්පාඩු විෂයයන් සඳහා පමණි.<br>ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙන් සඳහා විෂය නිර්දේශය පරිවර්තනය කර ඇත. ඉංග්‍රීසි භාෂා අංශය සමග සම්බන්ධ වී පිරිවෙන් පෙළපොත් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමට කටයුතු කරමින් පවතින අතර ප්‍රශ්න පත්‍ර විභාග දෙපාර්තමේන්තුවෙන් ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙන් සඳහා පරිවර්තනය කර ලබාදෙනු ලබයි.<br><br>පිරිවෙන් පරිහානිය සම්බන්ධයෙන් ඒ ඒ ආයතනවල කෘත්‍යාධිකාරි ස්වාමීන් වහන්සේලා හා පරිවෙණාධිපති ස්වාමීන් වහන්සේලා පෞද්ගලිකව වගකිව යුතු බව පෙනෙයි. අධ්‍යාපන අමාත්‍යාංශය හා එහි පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්යය වනුයේ අධ්‍යාපනික කටයුතු වර්ධනය කිරීම සඳහා උපකාරී වීම හා සහය වීමයි. ඊට අදාළ සියලු කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවෙන් නොඅඩුව ඉටු කරනු ලැබේ.</td>
</tr>
<tr>
<td>6.</td>
<td>Sky Management ආයතනය මඟින් නිර්මාණය කර ඇති පරිගණක වැඩසටහනක් පිළිබඳ ඉදිරිපත් කිරීම එම ආයතනයෙන් සහභාගී වූ නිලධාරීන් විසින් සිදුකල අතර මෙය ඔවුන් සමාජමය වගකීමක් ලෙස ස්වෙච්ඡාවෙන් සිදුකල කාර්යයක් බවද සඳහන් කරන ලදී. මෙමඟින් සියලු ශිෂ්‍යත්වලාභීන්ගේ දත්ත පද්ධතියක් පවත්වා ගෙන යමින් ඔවුනගේ බැංකු ගිණුම්වලට මුදල් ගෙවීමේ පහසුකම ඇති බවත්, විදුහල්පතිවරුන්ට ලබාදී ඇති බවත් ඔවුන් සඳහන් කරන ලදී.<br><br>මෙම පරිගණක පද්ධතිය පිළිබඳ පළාත් සභා දැනුවත් කර ඔවුන්ගේ එකඟතාවය ලබා ගෙන පළාත් සභා පාසැල් ඇතුළු සියළු පාසැල් සඳහා අමාත්‍යාංශය මඟින් ශිෂ්‍යාධාර ගෙවීමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කරන ලදී.<br>මෙම පරිගණක පද්ධතිය 2018 ඔක්තෝම්බර් මස 01 දින සිට ජාතික පාසැල් සඳහා ක්‍රියාත්මක කරන ලෙසත්, 2019 ජනවාරි 01 දින සිට සියලු පාසැල් සඳහා ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදී.</td>
<td>Sky Management Systems ආයතනය මඟින් Online වැඩසටහන සකස් කරන ලදි .<br><br>ඒ අනුව මේ දක්වා ඉටුකර ඇති කාර්යයන් පහත පරිදි වේ.<br>
<table>
<tr><th>ඉටුකර ඇති කාර්යයන්</th><th>කාල වකවානුව</th></tr>
<tr><td>01. හෝමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර යන කලාපයන්හි නියාමන වැඩසටහන ක්‍රියාත්මක කිරීම . එහිදී ශිෂ්‍යාධාර මාර්ගගත වැඩසටහන මඟින් ගෙවීම් සිදුකිරීම.</td><td>සැප්තැම්බර් 2018 සිට අද දක්වා</td></tr>
<tr><td>02. මෙම වැඩසටහන දීපව්‍යාප්තව ඉටුකිරීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාල වල විෂය සම්බන්ධීකරණ නිලධාරී සහ විෂය ලිපිකරු සම්පත්දායකයන් ලෙස පුහුණු කිරීම.</td><td>2018සැප්තැම්බර් 2018 - නොවැම්බර්</td></tr>
<tr><td>03. එම සම්පත්දායකයින් විසින් ජාතික පාසල්වල විෂය භාර නියෝජ්‍ය විදුහල්පති සහ විෂය ලිපිකරු එම වැඩසටහන සඳහා පුහුණු කිරීම.</td><td>- ජනවාරි 2019 2019පෙබරවාරි</td></tr>
<tr><td>04. 5 ශ්‍රේණි ශිෂ්‍යාධාර ජාතික පාසල් සඳහා ගෙවීම සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛය නිකුත් කිරීම</td><td>- 2019පෙබරවාරි</td></tr>
<tr><td>05. 5ශ්‍රේණි ශිෂ්‍යාධාර හිමි සියළු සිසුන්ගේ තොරතුරු ජාතික පාසල් විසින් ඇතුළත් කිරීම</td><td>2019 පෙබරවාරි- අප්‍රේල්</td></tr>
</table>
</td>
</tr>
</table>

| | |
|---|---|
| 06. 5ශ්‍රේණි ශිෂ්‍යාධාර මාර්ගගත වැඩසටහනෙහි දත්ත ඇතුළත් කිරීම සම්බන්ධ ප්‍රගති සමාලෝචන සිදුකිරීම. | 2019 මාර්තු - අප්‍රේල් |

**<u>සැලසුම් කර ඇති ඉදිරි වැඩසටහන්</u>**

| කාර්යයන් | කාල වකවානුව |
|---|---|
| මෙම මාර්ගගත වැඩසටහන නිල වශයෙන් දියත් කිරීම. | |
| 01. 5 ශ්‍රේණි ශිෂ්‍යාධාර මාර්ගගත වැඩසටහනේ ගෙවීම් කලාප මට්ටමින් සිදු කිරීම.<br>මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශය මුදා හරින ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා කලාප අධ්‍යාපන කාර්යාලයට ලබාදෙනු ලබයි. ශිෂ්‍ය ගිණුම්වලට මුදල් බැර කිරීම සඳහා මෙම මාර්ගගත වැඩසටහනින් මාසිකව ස්වයංක්‍රීයව සකස්වන Slip file එක download කර කලාප අධ්‍යාපන කාර්යාලය විසින් චෙක්පත සමඟ අදාල බැංකුව වෙත යොමු කරනු ලබයි. | 2019 අප්‍රේල් සිට ඉදිරියට |
| 02. ප්‍රගති සමාලෝචනය | 2019 මැයි සිට ඉදිරියට |
| 03. පිරිවෙන් සහ පෞද්ගලික පාසල් මාර්ගගත වැඩසටහන සඳහා එක් කිරීම . | 2019 ජුනි සිට ඉදිරියට |
| 04. මාර්ගගත වැඩසටහනින් සියළු ජාතික පාසල් සඳහා ගෙවීම් සිදුකිරීම .ප්‍රගති සමාලෝචනය තුළින් නියාමන හා ගැටළුවලට විසඳුම් ලබාදීම. | 2019 ජනවාරි සිට ඉදිරියට |
| 05. පළාත් පාසල් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම මාර්ගගත වැඩසටහනින් සිදුකිරීම හා චක්‍රලේඛය නිකුත්කිරීම . | 2019 ජනවාරි සිට ඉදිරියට |

<table>
<tr>
<td>7.</td>
<td>සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළු සියළුම තොරතුරු ඇතුළත් ක්‍රමවත් පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීම හා ඊට අදාල ඉදිරිපත් කිරීමක් (Power point Presentation) සිදු කරන ලෙස ලබාදුන් නියෝගය<br><br>පරිගණක පද්ධතිය කාරක සභාවේ අගය කිරීමට ලක්වූ අතර සිසුන්ගේ හා ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීමද පද්ධතිය මඟින් සිදු කිරීමේ හැකියාව සොයා බලන ලෙස කාරක සභාව මෙහිදී යෝජනා කරන ලදී.<br><br>මෙම පරිගණක දත්ත පද්ධතියේ මූලිකාංග, ඉන් සිදුකල හැකි කාර්යයන්, පද්ධතියට අදාල මානව හා භෞතික සම්පත් කළමනාකරණය සිදු කරන ආකාරය, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ආකාරය, දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා එය අඛණ්ඩව පවත්වා ගෙන යාම ආදී සියලු කරුණු හා දින වකවානු ඇතුළත් කාර්ය සැලැස්මක් 2018 සැප්තැම්බර් 14 දින වන විට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදී.</td>
<td>
<table>
<tr><th>කාර්යය</th><th>අවසන් කිරීමට බලාපොරොත්තු වූ දිනය</th><th>ප්‍රගතිය</th></tr>
<tr><td>කලාප අධ්‍යාපන කාර්යාල මඟින් ගුරුභවතුන්ගේ තොරතුරු මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙත ඇතුළත් කිරීම. පද්ධතිය අදාළව නව ගුරුපත්වීම් ලියාපදිංචි කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු ආදි කරුණු යාවත්කාලීන කිරීම.</td><td>2019.04.30</td><td>2019.04.30 දිනට අදාළ නව ලියාපදිංචි කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.</td></tr>
<tr><td>පාසල් සංගණනය කටයුතු සඳහා පරිගණක තොරතුරු පද්ධතියක් සකස් කිරීම.</td><td>2019.07.30</td><td>පරිගණක වැඩසටහන් සකස් කිරීම පිළිබඳ නිපුණතාවයක් සහිත පෞද්ගලික ආයතනයක් ප්‍රසම්පාදන ක්‍රම භාවිතයෙන් තෝරා ගෙන පරිගණක වැඩසටහන හා එහි ආකෘතිය සැකසීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර ජුලි මස මැද වන විට එම පරිගණක වැඩසටහනේ ශක්‍යතාව පරීක්ෂා කිරීමට සැලසුම් කර ඇත.</td></tr>
<tr><td>විදුහල්පති හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනිකුත් කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය සකස් කිරීම. (SLEAS, SLTS, SLPS, කනිෂ්ඨ සේවා)</td><td>2019.12.31</td><td>මෙම පද්ධතින් මේ වන විට නිර්මාණය කරමින් පවතී.</td></tr>
<tr><td>සියලුම පළාත් හා කලාප සඳහා දත්ත කළමනාකරණ ඒකකයක් ඇති කිරීම<br><br>i. ඒ සඳහා අවශ්‍ය නිලධාරි මණ්ඩලය පත් කර ගැනීම. (SLEAS, IT Service, IT Assistant, Development Officer) ගණන අනුපාතිකය අනුව නිලධාරීන් ගණන තීරණය කිරීම.<br><br>II. අවශ්‍ය උපකරණ සපයා ගැනීම අන්තර්ජාල</td><td>2018.12.31<br><br>2018.12.31</td><td>අවශ්‍ය උපදෙස් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වලට ලබා දී ඇත.<br><br>අන්තර්ජාල පහසුකම් ලංකා</td></tr>
</table>
</td>
</tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | | පහසුකම් පරිගණක උපාංග | 2019.12.31 | රාජ්‍ය ජාලය (LGN) යටතේ ලබා දී ඇත. පරිගණක උපාංග ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත යොමු කර ඇත. |
| | | පාසල් සඳහා සුවිශේෂී පොදු අං කයක් (Unique No) ලබා දීමට කටයුතු කිරීම. (විභාග දෙපාර්තමේන්තුවේ පාසල් අංකය, අමාත්‍යාංශයේ පාසල් සංගණන අංකය) | 2019.07.30 | සංඛ්‍යා ලේඛන ශාඛාව විසින් විභාග දෙපාර්තමේන්තුවේ පාසල් ලැයිස්තුව මේ වන විට ලබා ගෙන එම අධ්‍යයන කරමින් පවතින අතර, පාසල් සඳහා සුවිශේෂී පොදු අංකයක් අංකයක් (Unique No) සඳහා අමාත්‍යාංශයේ යෝජනාව ජුනි මස අවසන් වන විට සකස් කල හැකි අතර අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර ජූලි මස වන විට අවසන් තීරණය ගත හැක. |
| | | පාසල් සිසුන්ගේ මාර්ගගත දත්ත පද්ධතියට ඇතුලත් කිරීම හා යාවත්කාලීන කිරීම කටයුතු කිරීම 2019 වසරේ 1 ශ්‍රේණියට ඇතුලත් වන සියලු සිසුන්ගේ දත්ත පද්ධතියට යොමු කිරීම | 2019.02.10 | මෙම දත්ත පද්ධතියට සිසුන්ගේ දත්ත මේ වන විට ඇතුළත් කරමින් පවති. |
| | | ගුරුභවතුන්ගේ මානව සම්පත තොරතුරු පද්ධතිය හා සම්බන්ධ චක්‍රලේඛනය නිකුත් කිරීම | 2019.06.01 | චක්‍රලේඛනය කෙටුම්පත් කර අවසන් කර ඇත. ඉදිරියේදි නිකුත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත. |
| | | සියලුම පද්ධතීන් අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් කේන්ද්‍රස්ථායකින් පවත්වාගෙන යාම | 2019.01.01 | මාර්ගගත දත්ත පද්ධතීන් සම්බන්ධ කටයුතු දත්ත කළමනාකරණ ශාඛාව මඟින් මේ වන විට සිදු කරනු ලැබේ. |